සැ.යු .- 2016.09.15 වැනි දින පළ වූ අංක 1985 දරන *ගැසට් පත්‍රයේ* VI අ කොටස පළ නොවී ය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,986 - 2016 සැප්තැම්බර් මස 23 වැනි සිකුරාදා - 2016.09.23**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡේදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 948 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |

| | පිටුව |
|---|---|
| රජයේ නිවේදන ... ... ... | 955 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 960 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |

සැ. යු. - රජිත කොඩිතුවක්කු පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2016 ජූනි මස 17 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් *භාරගැනීම ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2016 ඔක්තෝබර් මස 14 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2016 සැප්තැම්බර් මස 30 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය.''*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති. (*වැ. බ.*).

2016 සැප්තැම්බර් මස 15 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

947 – B 081100 —403 (2016/09)
A 1-

# ජනාධිපතිතුමා විසින් කරන ලද පත්කිරීම් ආදිය

2016 අංක 856

MOD/DEF/2/01/ARF/RET/422.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක් සහ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීමක්

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරි 2013 සැප්තැම්බර් මස 10 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් ජෙනරල් රංජිත් වර්නන් සමරතුංග, ආර්ඩබ්පී, ආර්එස්පී (නි/50956)

**නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීමක්**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරි 2013 සැප්තැම්බර් මස 10 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් ජෙනරල් රංජිත් වර්නන් සමරතුංග, ආර්ඩබ්පී, ආර්එස්පී (නි/50956)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2013 ජුනි මස 28 වැනි දින,
කොළඹ දී ය.

09 - 751

---

2016 අංක 857

DRF/RECT/770 (30).

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල උසස් කිරීම්, තනතුරු අත්හැරීම් හා පත් කිරීම්

**උසස් කිරීම**

පහත නම් සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරීන් 2010 ජුනි මස 30 වැනි දින සිට තාවකාලික මේජර් ජෙනරල් නිලයට උසස් කිරීම් අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

(අ) බ්‍රිගේඩියර් ඊ කේ ජේ කේ විජයසිරි, එල්එස්සී
(ආ) බ්‍රිගේඩියර් එස්. ඒ ඒ එල් පෙරේරා, ආර්ඩබ්පී, ආර්එස්පී, යූඑස්පී, අයිජී.
(ඇ) බ්‍රිගේඩියර් යූ ඒ බී මැදවල, යූඑස්පී. පීඑස්සී.
(ඈ) බ්‍රිගේඩියර් වී යූ බී නානායක්කාර, යූඑස්පී, එච්ඩීඑම්සී
(ඉ) බ්‍රිගේඩියර් එම් එච් එස් බී පෙරේරා, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී

**තනතුරු අත්හැරීම් හා පත්කිරීම්**

පහත නම් සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ තනතුරු අත්හැරීම් හා පත්කිරීම් 2010 ජුනි මස 30 වැනි දින සිට ක්‍රියාත්මක කිරීම අතිග රු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

(අ) බ්‍රිගේඩියර් (තාවකාලික මේජර් ජෙනරල්) ඊ කේ ජේ කේ විජයසිරි, එල්එස්සී - ශ්‍රී ලංකා යුද හමුදා ස්වේච්ඡා බලසේනා මූලස්ථානයේ බ්‍රිගේඩියර් (පාලන හා භට කාර්යය සම්පාදක) තනතුර අත්හැරීම හා ආඥාපති ඉදිරි නඩත්තු පෙදෙස (උතුරු මැද) වශයෙන් පත් කිරීම.
(ආ) බ්‍රිගේඩියර් (තාවකාලික මේජර් ජෙනරල්) එස් ඒ ඒ එල් පෙරේරා, ආර්ඩබ්පී, ආර්එස්පී, යූඑස්පී, අයිජී - ශ්‍රී ලංකා යුධ හමුදා ස්වෙච්ඡා බලසේනා මූලස්ථානයේ ප්‍රධාන මාණ්ඩලික නිලධාරි තනතුර අත්හැරීම හා 52 වන සේනාංකයේ සේනාංකාධිපති වශයෙන් පත් කිරීම.
(ඇ) බ්‍රිගේඩියර් (තාවකාලික මේජර් ජෙනරල්) යූ ඒ බී මැදවල යූඑස්පී, පීඑස්සී, - උප ප්‍රදේශ මූලස්ථානය (රත්නපුර) ආඥාපති තනතුර අත්හැරීම හා 57 වන සේනාංකයේ සේනාංකාධිපති වශයෙන් පත් කිරීම.
(ඈ) බ්‍රිගේඩියර් (තාවකාලික මේජර් ජෙනරල්) වී යූ බී නානායක්කාර, යූඑස්පී, එච්ඩීඑම්සී - යුද හමුදා මූලස්ථානයේ ජනමාධ්‍ය අධ්‍යක්ෂක තනතුර අත්හැරීම හා යුද හමුදා මූලස්ථානයේ විධායක අධිකාරි ජෙනරල් වශයෙන් පත් කිරීම.
(ඉ) බ්‍රිගේඩියර් (තාවකාලික මේජර් ජෙනරල්) එච් එච් එස් බී පෙරේරා, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී - ආරක්ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) බ්‍රිගේඩියර් (ප්‍රධාන මාණ්ඩලික) තනතුර අත්හැරීම හා ආඥාපති ඉදිරි නඩත්තු පෙදෙස (උතුර) වශයෙන් පත් කිරීම.

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය.

2010 ජූලි මස 27 වැනි දින,
කොළඹ දී ය.

09 - 758

2016 අංක 858

DRF/RECT/770 (25).

### ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීම්, උසස් කිරීම්, තනතුරු අත්හැරීම් හා පත් කිරීම්

#### නිල ස්ථිර කිරීම්

1. පහත නම් සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරීන් දක්වා ඇති දිනයන් සිට බ්‍රිගේඩියර්වරුන් වශයෙන් නිල ස්ථිර කිරීම් අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

*(අ) 2008 ඔක්තෝබර් මස 01 වැනි දින සිට :*

(1) කර්නල් (තාවකාලික බ්‍රිගේඩියර්) සුදන්ත රණසිංහ ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී.
(2) කර්නල් (තාවකාලික බ්‍රිගේඩියර්) කොඩිකාර ජගත් විජේතිලක, ආර්ඩබ්පී, යූඑස්පී, පීඑස්සී.
(3) කර්නල් (තාවකාලික බ්‍රිගේඩියර්) ලසන්ත නාත් වික්‍රමසූරිය, ආර්එස්පී, යූඑස්පී, පීඑස්සී.
(4) කර්නල් (තාවකාලික බ්‍රිගේඩියර්) මිහිඳුකුලසූරියගේ හෙන්රි ප්‍රේමනාත් මිහිඳුකුලසූරිය, යූඑස්පී, පීඑස්සී, එල්එස්සී.

*(ආ) 2008 ඔක්තෝබර් මස 16 වැනි දින සිට :*

(1) කර්නල් (තාවකාලික බ්‍රිගේඩියර්) නන්එදිරි උපේන්ද්‍ර මහේෂ් මැගිලියන් වීරතුංග සේනානායක, ආර්ඩබ්පී, ආර්එස්පී, යූඑස්ඒසීජීඑස්සී.
(2) කර්නල් (තාවකාලික බ්‍රිගේඩියර්) නන්දලාල් ජනක වල්ගම, ආර්එස්පී, යූඑස්පී, පීඑස්සී
(3) කර්නල් (තාවකාලික බ්‍රිගේඩියර්) එඩ්වඩ් තෙවනේෂන් තන්ජරත්නම්, යූඑස්පී, පීඑස්සී.
(4) කර්නල් (තාවකාලික බ්‍රිගේඩියර්) කුරුප්පුගේ ජගත් අල්විස්, ආර්ඩබ්පී, ආර්එස්පී, යූඑස්පී, පීඑස්සී.
(5) කර්නල් (තාවකාලික බ්‍රිගේඩියර්) රණසිංහ ආරච්චිගේ අනුර ආරියවංශ පෙරේරා, ආර්එස්පී.
(6) කර්නල් (තාවකාලික බ්‍රිගේඩියර්) විජිත නිර්මල් කොස්වත්ත, ආර්එස්පී.

#### උසස් කිරීම්

2. පහත නම් සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරීන් 2009 ජූලි මස 01 වැනි දින සිට තාවකාලික මේජර් ජෙනරල් නිලයට උසස් කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

(අ) බ්‍රිගේඩියර් හර්ෂ ලක්ෂ්මන් වීරතුංග, යූඑස්පී, එල්එස්සී.
(ආ) බ්‍රිගේඩියර් අකුරටියගේ ලලිත් රාජ් විජේතුංග, යූඑස්පී.
(ඇ) බ්‍රිගේඩියර් නන්එදිරි උපේන්ද්‍ර මහේෂ් මැගිලියන් වීරතුංග සේනානායක, ආර්ඩබ්පී, ආර්එස්සී, යූඑස්ඒසීජීඑස්සී.
(ඈ) බ්‍රිගේඩියර් නන්දලාල් ජනක වල්ගම, ආර්එස්පී, යූඑස්පී, පීඑස්සී.
(ඉ) බ්‍රිගේඩියර් කුරුප්පුගේ ජගත් අල්විස්, ආර්ඩබ්පී, ආර්එස්පී, යූඑස්පී, පීඑස්සී.

#### නිල ස්ථිර කිරීම්

3. පහත නම් සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරීන් දක්වා ඇති දිනයන් සිට මේජර් ජෙනරල්වරුන් වශයෙන් නිල ස්ථිර කිරීම් අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

*(අ) 2009 ජූලි මස 03 වැනි දින සිට :*

(1) බ්‍රිගේඩියර් (තාවකාලික මේජර් ජෙනරල්) ජගත් ජයසූරිය, යූඑස්පී, එන්ඩීයූ, පීඑස්සී.
(2) බ්‍රිගේඩියර් (තාවකාලික මේජර් ජෙනරල්) මල්වත්තගේ චන්දිම මෙන්දක පෙරේරා සමරසිංහ, ආර්ඩබ්පී, ආර්එස්පී, යූඑස්පී. එන්ඩීසී. පීඑස්සී.
(3) බ්‍රිගේඩියර් (තාවකාලික මේජර් ජෙනරාල්) හර්ෂ ලක්ෂ්මන් වීරතුංග, යූඑස්පී, එල්එස්සී.
(4) බ්‍රිගේඩියර් (තාවකාලික මේජර් ජෙනරල්) ජන්මික ජගච්චන්ද්‍රනාත් ප්‍රතාපසිංහ සේනාපති තල්අරඹේ ලියනගේ, ආර්එස්පී, යූඑස්පී. එන්ඩීසී, අයිජී, එල්ඩීඑම්සී.

#### අත්හැරීම් හා පත්කිරීම්

4. පහත නම් සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ තනතුරු අත්හැරීම් හා පත්කිරීම් 2009 ජූලි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

(අ) මේජර් ජෙනරල් එච් එල් වීරතුංග, යූඑස්පී, එල්එස්සී - යුද්ධ හමුද මූලස්ථානයේ අයවැය හා මුදල් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂක තනතුර අත්හැරීම හා යුද්ධ හමුදා මූලස්ථානයේ මූල්‍ය පරිපාලන ශාඛාවේ අධ්‍යක්ෂ ජෙනරල් වශයෙන් පත්කිරීම.
(ආ) බ්‍රිගේඩියර් (තාවකාලික මේජර් ජෙනරල්) ඒ එල් ආර් විජේතුංග යූඑස්පී - යුද්ධ හමුදා මූලස්ථානයේ විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යක්ෂක මණ්ඩලයේ අධ්‍යක්ෂක තනතුර අත්හැරීම හා යුද්ධ හමුදා මූලස්ථානයේ උපකරණ මාස්ටර් ජෙනරල් වශයෙන් පත්කිරීම.
(ඇ) බ්‍රිගේඩියර් (තාවකාලික මේජර් ජෙනරල්) එන් යූ එම් එම් ඩබ් සේනානායක, ආර්ඩබ්පී, ආර්එස්පී, යූඑස්ඒසීජීඑස්සී- යුද්ධ හමුදා මූලස්ථානයේ සැලසුම් අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂක තනතුර අත්හැරීම හා මෙහෙයුම් ආඥපති කොළඹ වශයෙන් පත්කිරීම.
(ඈ) බ්‍රිගේඩියර් (තාවකාලික මේජර් ජෙනරල්) එන් ජේ වල්ගම, ආර්එස්පී, යූඑස්පී, පීඑස්සී - 22 වන සේනාංක මූලස්ථානයේ කාර්ය නියුක්ත සේනාංකාධිපති තනතුර අත්හැරීම හා 22 වන සේනාංක මූලස්ථානයේ සේනාංකාධිපති වශයෙන් පත්කිරීම.
(ඉ) බ්‍රිගේඩියර් (තාවකාලික මේජර් ජෙනරල්) කේ ජේ අල්විස්, ආර්ඩබ්පී, ආර්එස්පී, යූඑස්පී, පීඑස්සී - ජනාධිපති ආරක්ෂක සේනාවේ ආරක්ෂක සම්බන්ධීකරණ වශයෙන් පත්කිරීම.

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2009 ජූලි මස 08 වැනි දින,
කොළඹ දී ය.

09 - 802

2016 අංක 859

MOD/DEF/2/01/ARF/PRO/SSC/04.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල උසස් කිරීමක්

**උසස් කිරීම**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරී 2014 දෙසැම්බර් මස 30 වැනි දින සිට තාවකාලික කර්නල් නිලයට උසස් කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

ලුතිනන් කර්නල් ආර් එම් එම් මොනරාගල, යූඑස්පී, ශ්‍රීලයුවෙබ (නි/62179)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

බී එම් යූ ඩී බස්නායක,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 මාර්තු මස 18 වැනි දින,
කොළඹ දී ය.

09 - 750

---

2016 අංක 860

MOD/DEF/2/01/ARF/RET/678.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක් සහ විශ්‍රාම ගැනීමක්

**නිල ස්ථිර කිරීමක්**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරී 2014 නොවැම්බර් මස 07 වැනි දින සිට ලුතිනන් කර්නල් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

තාවකාලික ලුතිනන් කර්නල් ජසෙන්තු කංකානම්ගේ ගාමිණී සිරිශාන්ත, ඉසේබ (නි/61889)

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරී 2014 නොවැම්බර් මස 08 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදවේ ස්ථිර බල හමුදවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

ලුතිනන් කර්නල් ජසෙන්තු කංකානම්ගේ ගාමිණී සිරිශාන්ත, ඉසේබ (නි/61889)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2014 ජූලි මස 24 වැනි දින,
කොළඹ දී ය.

09 - 755

---

2016 අංක 861

MOD/DEF/2/01/ARF/REM/550.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක් සහ වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැනීමක්

**නිල ස්ථිර කිරීමක්**

පහත නම සඳහන් නිලධාරී 2013 සැප්තැම්බර් මස 07 වැනි දින සිට මේජර් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

තාවකාලික මේජර් තුෂාර සෞම්‍යසිරි හල්ඹඑවේගෙදර, ආර්එස්පී, ගරෙ (නි/65407)

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරී 2013 සැප්තැම්බර් මස 08 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදවේ ස්ථිර බල හමුදවෙන් වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් තුෂාර සෞම්‍යසිරි හල්ඹඑවේගෙදර, ආර්එස්පී, ගරෙ (නි/65407)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2014 පෙබරවාරි මස 28 වැනි දින,
කොළඹ දී ය.

09 - 753

2016 අංක 862

MOD/DEF/2/01/ARF/REM/553.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද
නිල ස්ථිර කිරීමක් සහ වෛද්‍ය හේතුන් මත
විශ්‍රාම ගැනීමක්

**නිල ස්ථිර කිරීමක්**

පහත නම සඳහන් නිලධාරි 2013 නොවැම්බර් මස 23 වැනි දින සිට මේජර් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

තාවකාලික මේජර් කුමාර බණ්ඩාර තුසිත රුවන් කුමාර රත්වත්ත, ආර්එස්පී. ගරෙ (නි/65714)

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරි 2013 නොවැම්බර් මස 24 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදවේ ස්ථිර බල හමුදවෙන් වෛද්‍ය හේතුන් මත විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් කුමාර බණ්ඩාර තුසිත රුවන් කුමාර රත්වත්ත, ආර්එස්පී. ගරෙ (නි/65714)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2014 පෙබරවාරි මස 28 වැනි දින,
කොළඹ දී ය.

09 - 754

---

2016 අංක 863

MOD/DEF/2/01/ARF/RET/666.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද
නිල ස්ථිර කිරීමක් සහ විශ්‍රාම ගැනීමක්

**නිල ස්ථිර කිරීමක්**

පහත නම සඳහන් නිලධාරිණී 2015 ජනවාරි මස 30 වැනි දින සිට මේජර් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

තාවකාලික මේජර් වඩුගේ ලක්මාලි අයෝමි දයාසේන, ශ්‍රීලයුවෛබ (නි/65341)

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරිණී 2015 ජනවාරි මස 31 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදවේ ස්ථිර බල හමුදවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් වඩුගේ ලක්මාලි අයෝමි දයාසේන, ශ්‍රීලයුවෛබ (නි/65341)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2014 ජූලි මස 24 වැනි දින,
කොළඹ දී ය.

09 - 756

---

2016 අංක 864

MOD/DEF/2/01/ARF/PRO/MAJ/03.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද
නිල උසස් කිරීම්

පහත නම් සඳහන් නිලධාරීන් 2014 ජනවාරි මස 14 වැනි දින සිට තාවකාලික මේජර් නිලයට උසස් කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

(*අ*) කපිතන් පසික්කු හැන්නදිගේ හර්ෂනාත් චන්දන සමරතිලක, ශ්‍රීලසසබ (නි/66146)

(*ආ*) කපිතන් රත්නායක මුදියන්සේලාගේ අනුරුද්ධ රත්නායක, විබ (නි/66147)

(*ඇ*) කපිතන් හපුතන්තිරිගේ දොන් දුමින්ද නාලක බොනිෆස් ජයසූරිය, ගැජෙබ (නි/66148)

(*ඈ*) කපිතන් ඉඹුලාවල වලව්වේ එරන්ද උපමාල් ඉඹුලාවල, කරෙ (නි/66150)

(*ඉ*) කපිතන් තලගොඩගේ රවි ප්‍රභාෂ්වර ලැනරෝල්, ශ්‍රීලකාහ (නි/66154)

(*ඊ*) කපිතන් රුවන් නාලක සූරියආරච්චි, ශ්‍රීලකාහ (නි/66158)

(*උ*) කපිතන් සමරකෝන් මුදියන්සේලාගේ නිලංක මධුශංක සමරකෝන්, විපාරෙ (නි/66163)

(ඌ) කපිතන් හේරත් මුදියන්සේලාගේ චින්තක චරිත් සූරියබණ්ඩාර, ශ්‍රීලයුපොහේබ (නි/66165)

(එ) කපිතන් රත්නායක මුදියන්සේලාගේ පොල්වත්තේ ගෙදර ලසිත චාමිකර සමරකෝන්, ශ්‍රීලකාහ (නි/66167)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2014 පෙබරවාරි මස 07 වැනි දින,
කොළඹ දී ය.

09 - 801

---

2016 අංක 865

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදව

### අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක් සහ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීමක්

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරි 2013 ඔක්තෝබර් මස 20 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදවේ ස්ථිර බල හමුදවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

කපිතන් (උපකරණ පාලක) ගාල්ලගේ මර්වින් ජෝසප් පීරිස් ශ්‍රීලයුපොදුසේබ (නි/62668)

**නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීමක්**

පහත නම සඳහන් නිලධාරි 2013 ඔක්තෝබර් මස 20 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදවේ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

කපිතන් (උපකරණ පාලක) ගාල්ලගේ මර්වින් ජෝසප් පීරිස්, ශ්‍රීලයුපොදුසේබ (නි/62668)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2013 ජූලි මස 17 වැනි දින,
කොළඹ දී ය.

09 - 759

2016 අංක 866

DRF/2/1/RECT/2696.

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදව

### අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීමක්

පහත නම් සඳහන් නිලධාරීන් ඔවුන්ගේ නම් ඉදිරියෙන් දක්වා ඇති දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදවේ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

(අ) කපිතන් හක්ස්ලි සුරේන් දිසානායක, ශ්‍රීලංසංබ (නි/62919) - 2002 නොවැම්බර් 06

(ආ) කපිතන් දිසානායක මුදියන්සේලාගේ අනුර ජීවානන්ද දිසානායක, ශ්‍රීලයුපොදුසේබ (නි/63844) - 2006 මැයි 01

(ඇ) කපිතන් සුභසිංහ ආරච්චිලාගේ නන්දන සුභසිංහ, ශ්‍රීලපාහ (නි/63687) - 2008 මැයි 28

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2009 ජනවාරි 12 වැනි දින,
කොළඹ දී ය.

09 - 803

---

2016 අංක 867

DRF/RECT/580 (VI) AY.

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදව

### අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද මරණින් පසු නිල උසස් කිරීම

පහත නම් සඳහන් නිලධාරීන්ගේ මරණයෙන් පසු නිල උසස් කිරීම් අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර තිබේ.

(අ) කපිතන් නාරංගොඩ පරණ හේවගේ ලසන්ත මහේෂ් කුමාර නාරංගොඩ, ශ්‍රීලපාහ (නි/65138) - 2008 දෙසැම්බර් මස 19 වැනි දින සිට මරණයෙන් පසු මේජර් නිලයට උසස් කිරීම.

(ආ) කපිතන් කොළමුන්න ගල්ගානගේ තරංග ලක්මාල් තේලිස්, ශ්‍රීලපාහ (නි/65239) - 2008 දෙසැම්බර් මස 20 වැනි දින සිට මරණයෙන් පසු මේජර් නිලයට උසස් කිරීම.

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2009 පෙබරවාරි මස 10 වැනි දින,
කොළඹ දී ය.

09 - 749

---

2016 අංක 868

MOD/DEF/02/01/ARF/REM/501.

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදව

## අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැනීමක්

### විශ්‍රාම ගැනීමක්

පහත නම සඳහන් නිලධාරි 2013 අගෝස්තු මස 01 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදවේ ස්ථිර බල හමුදවෙන් වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

කපිතන් ගරාගොඩ ලියනරාලලාගේ මංජුල සම්පත් ගරාගොඩ, ආර්එස්පී, ශ්‍රීලපාහ (නි/65205)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2013 නොවැම්බර් මස 29 වැනි දින,
කොළඹ දී ය.

09 - 760

---

2016 අංක 869

MOD/DEF/2/01/ARF/RES/793.

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදව

## අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අධිකාරියෙන් ඉල්ලා අස්වීමක්

ශ්‍රී ලංකා යුද්ධ හමුදවේ ස්ථිර බල හමුදවේ පහත නම සඳහන් නිලධාරි 2015 මාර්තු මස 31 වැනි දින සිට අධිකාරියෙන් ඉල්ලා අස්වීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

කපිතන් සමුර්දි හර්ෂනාත් රාජපක්ෂ, ශ්‍රීලංසංබ (නි/66346)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

බී එම් යූ ඩී බස්නායක,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 පෙබරවාරි මස 26 වැනි දින,
කොළඹ දී ය.

09 - 800

---

2016 අංක 870

MOD/DEF/2/01/ARF/RET/444

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදව

## අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක් සහ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීමක්

### විශ්‍රාම ගැනීමක්

පහත නම සඳහන් නිලධාරි 2013 නොවැම්බර් මස 03 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදවේ ස්ථිර බල හමුදවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

ලුතිතන් (උපකරණ පාලක) දෙන් රංජිත් වික්‍රමසිංහ, ශ්‍රීලයුපොදුසේබ (නි/67044)

### නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීමක්

පහත නම සඳහන් නිලධාරි 2013 නොවැම්බර් මස 03 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදවේ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

ලුතිතන් (උපකරණ පාලක) දෙන් රංජිත් වික්‍රමසිංහ, ශ්‍රීලයුපොදුසේබ (නි/67044)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2013 ජූලි මස 30 වැනි දින,
කොළඹ දී ය.

09 - 799

MOD/DEF/2/01/ARF/REM/388.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද වෛද්‍ය හේතුන් මත අස් කිරීමක්

**අස් කිරීමක්**

පහත නම සඳහන් නිලධාරී 2012 ජූලි මස 13 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදවේ ස්ථිර බල හමුදවෙන් වෛද්‍ය හේතුන් මත අස් කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

ලුතිනන් රණසිංහ මුදියන්සේලාගේ රජිත ලලන්ත බණ්ඩාර රණසිංහ, ශ්‍රීලයුවෛබ (නි/69001)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2013 මැයි මස 09 වැනි දින,
කොළඹ දී ය.

09 - 752

---

2016 අංක 871

MOD/DEF/2/01/ARF/REM/516.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද වෛද්‍ය හේතුන් මත විශ්‍රාම ගැනීමක්

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරී 2013 සැප්තැම්බර් මස 29 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදවේ ස්ථිර බල හමුදවෙන් වෛද්‍ය හේතුන් මත විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

ලුතිනන් විජේසේකර පතිරණගේ රංජිත් පතිරණ, ආර්එස්පී, ගැහේබ (නි/67273)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2013 දෙසැම්බර් මස 30 වැනි දින,
කොළඹ දී ය.

09 - 757

---

2016 අංක 872

MOD/DEF/2/01/ARF/RES/816.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අධිකාරියෙන් ඉල්ලා අස්වීමක්

ශ්‍රී ලංකා යුද්ධ හමුදවේ ස්ථිර බල හමුදවේ පහත නම සඳහන් නිලධාරී 2015 අප්‍රේල් මස 01 වැනි දින සිට අධිකාරියෙන් ඉල්ලා අස්වීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

ලුතිනන් යොෂාන් හදික ඔබේසේකර, ශ්‍රීලවියාඉ (නි/68472)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

බී එම් යූ ඩී බස්නායක,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 මාර්තු මස 18 වැනි දින,
කොළඹ දී ය.

09 - 747

---

2016 අංක 873

MOD/DEF/2/01/ARF/RES/888.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අධිකාරියෙන් ඉල්ලා අස්වීමක්

ශ්‍රී ලංකා යුද්ධ හමුදවේ ස්ථිර බල හමුදවේ පහත නම් සඳහන් නිලධාරී 2015 ඔක්තෝබර් මස 16 වැනි දින සිට අධිකාරියෙන් ඉල්ලා අස්වීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

දෙවන ලුතිනන් විදනගේ රඨික ශෙහාන් ද සිල්වා, ඉසේබ (නි/69698)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ඉංජි. කරුණාසේන හෙට්ටිආරච්චි,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 සැප්තැම්බර් මස 28 වැනි දින,
කොළඹ දී ය.

09 - 746

2016 අංක 874

MOD/DEF/2/01/ARF/RES/980.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අධිකාරියෙන් ඉල්ලා අස්වීමක්

ශ්‍රී ලංකා යුද්ධ හමුදවේ ස්ථිර බල හමුදවේ පහත නම සඳහන් නිලධාරි 2015 දෙසැම්බර් මස 31 වැනි දින සිට අධිකාරියෙන් ඉල්ලා අස්වීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

දෙවන ලුතිනන් වන්නිනායක මුදියන්සේලාගේ අමන්ද ඕෂද බණ්ඩාර වන්නිනායක, ඉසේබ (නි/68942)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ඉංජි. කරුණාසේන හෙට්ටිආරච්චි,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 නොවැම්බර් මස 20 වැනි දින,
කොළඹ දී ය.

09 - 748

---

# රජයේ නිවේදන

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

විවාහ සිදුකිරීම සඳහා දේවස්ථානය ලියාපදිංචි කිරීම

විවාහ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ (112 වැනි පරිච්ඡේදය) 10 වැනි වගන්තියේ විධි විධාන අනුව ඒකනායක මුදියන්සේලාගේ ගුණසේකර නමැති ලංකාවේ රෙජිස්ට්‍රාර් ජනරාල් වන මම ප්‍රසිද්ධ ක්‍රිස්තියානි දේවස්ථානයක් හැටියට ප්‍රයෝජනයට ගැනෙන පහත සඳහන් කරනු ලබන ගොඩනැගිල්ල, විවාහ සිදු කිරීම සඳහා විධි වූ පරිදි ලියාපදිංචි කර තිබෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

| *අංකය* | *ලියාපදිංචි කිරීමේ දිනය* | *විස්තරය* | *පිහිටීම* | *දේවගැතිතැන අයිතිකරු හෝ භාරකරු* | *ගොඩනැගිල්ල ලියාපදිංචි කරනු ලැබ ඇත්තේ කුමන ආගමක් වෙනුවෙන් ද* |
|---|---|---|---|---|---|
| 1483 | 2016.07.04 | එසෙම්බ්ලි ඔෆ් ගෝඩ් දේවස්ථානය, පරන්තන් | අංක 290, සිවපුරම්, පරන්තන් | ගරු වී. බාලක්‍රිෂ්ණන් පියතුමා | එසෙම්බ්ලීස් ඔෆ් ගෝඩ් ඔෆ් සිලෝන් (1947 අංක 53 දරන පාර්ලිමේන්තු පනතේ ස්ථාපිත) |

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2016 ක්වූ අගෝස්තු මස 31 වැනි දින,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ 3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

09 - 740/1

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### ගොඩනැගිල්ල ලියාපදිංචි කිරීමේ සහතිකය

සහතික අංශය : 1483

විවාහ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ (112 වැනි පරිච්ඡේදය) 10 වැනි වගන්තිය යටතේ කරන ලද ඉල්ලීම ප්‍රකාශය අනුව ඒකනායක මුදියන්සේලාගේ ගුණසේකර වන මම ප්‍රසිද්ධ ක්‍රිස්තියානි දේවස්ථානයක් හැටියට ප්‍රයෝජනයට ගැනෙන පහත විස්තර කරනු ලබන ගොඩනැගිල්ල, විවාහ සිදු කිරීම සඳහා විධි වූ පරිදි ලියාපදිංචි කර තිබෙන බව සහතික කරමි.

| විස්තර | පිහිටීම | | දිස්ත්‍රික්කය | දේවගැති තැන අයිතිකරු හෝ භාරකරු | ගොඩනැගිල්ල ලියාපදිංචි කරනු ලැබ ඇත්තේ කුමන ආගමක් වෙනුවෙන් ද |
|---|---|---|---|---|---|
| | ගම හෝ වීථිය සහ නගර කොට්ඨාසය | පත්තුව, කෝරළය හෝ දිස්ත්‍රික්කයේ වෙනත් කොට්ඨාසය | | | |
| එසෙම්බ්ලි ඔෆ් ගෝඩ් දේවස්ථානය පරන්තන් | අංක 290, සිවපුරම්, පරන්තන් | කණ්ඩාවලයි | කිලිනොච්චි | ගරු වී. බාල-ක්‍රිෂ්ණන් පියතුමා | එසෙම්බ්ලීස් ඔෆ් ගෝඩ් ඔෆ් සිලෝන් (1974 අංක 53 දරන පාර්ලිමේන්තු පනතේ ස්ථාපිත) |

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

වර්ෂ 2016ක් වූ අගෝස්තු මස 31 වැනි දින,
බත්තරමුල්ලේ දී මගේ අත්සන තබන ලදී.

09 - 740/2

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ ආඥාපනත

### 5 වගන්තිය යටතේ නිවේදනය

110 වෙනි අධිකාරිය වූ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 5 වන වගන්තියෙන් මා වෙත පැවරි ඇති බලතල ප්‍රකාරව ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍ය වජිර අබේවර්ධන වන මම 1935 සැප්තැම්බර් මස 20 වන දින අංක 8146 දරන *ගැසට් පත්‍රයේ* අතිරේකයෙහි පල කරනු ලැබූ නිවේදනයෙහි දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ යන ශීර්ෂයෙහි යටතේ,

හික්කඩුව සහ අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙහි අංක 7 හා 9 දරන විෂය වෙනුවට මෙහි "අ" උපලේඛනයේ සඳහන් ගම් ලැයිස්තු ඇතුළත් කිරීමෙන් අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මීටියාගොඩ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය ද,

ශීර්ෂ අංක 7 හා 9 ට ඉක්බිතිව "ආ" උපලේඛනයේ සඳහන් ගම් ලැයිස්තුව ඇතුළත් කිරීමෙන් මානම්පිට උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය ඇතුළත් කිරීමෙන් ද,

ශීර්ෂ අංක 7 හා 9 ට ඉක්බිතිව "ඇ" උපලේඛනයේ සඳහන් ගම් ලැයිස්තුව ඇතුළත් කිරීමෙන් ගෝනාපීනුවල උපත් මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය ඇතුළත් කිරීමෙන් ද,

2016 නොවැම්බර් මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන පරිදි මෙම නිවේදනයෙන් ප්‍රතිශෝධනය කරමි.

වජිර අබේවර්ධන,
ස්වදේශ කටයුතු අමාත්‍ය.

2016 අගෝස්තු මස 30 වැනි දින,
කොළඹ දී ය.

දකුණු පළාත ගාල්ල දිස්ත්‍රික්කය අම්බලන්ගොඩ
ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ යෝජිත මීටියාගොඩ
උපත් මරණ රෙජිස්ට්‍රාර් කොට්ඨාසයට අදාළ
ග්‍රාම නිලධාරි වසම් ලැයිස්තුව (අලුත්වල නම වියැකී යනු ඇත) 7/9

අ- උපලේඛනය

1. මැටිවල
2. වලකඩ
3. මීටියාගොඩ
4. දිද්දැලිය
5. උඩ කැරුව
6. එරනවිල
7. නවගම

දකුණු පළාත ගාල්ල දිස්ත්‍රික්කය ගෝනාපීනුවල
ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ යෝජිත කිරිඳිඇල
උපත් මරණ විවාහ රෙජිස්ට්‍රාර් කොට්ඨාසයට අදාළ
ග්‍රාම නිලධාරි වසම් ලැයිස්තුව - ශීර්ෂ අංක 07

ආ- උපලේඛනය

1. අලුත්වල
2. මානම්පිට
3. තිලකගම
4. බාන්වැල්ගොඩැල්ල
5. හේනගොඩ
6. මහගම්ගොඩ
7. දඟරගහ උඩුමුල්ල
8. ඊරියගහ උඩුමුල්ල
9. කරුවලබැද්ද
10. කිරිඳිඇල

දකුණු පළාත ගාල්ල දිස්ත්‍රික්කය ගෝනාපීනුවල
ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගෝනාපීනුවල
උපත් මරණ රෙජිස්ට්‍රාර් කොට්ඨාසයට අදාළ
ග්‍රාම නිලධාරි වසම් ලැයිස්තුව - ශීර්ෂ අංක 07

ඇ- උපලේඛනය

1. හික්කඩුව නැගෙනහිර
2. ආරච්චිකන්ද
3. ගෝනාපීනුවල නැගෙනහිර
4. ගෝනාපීනුවල බටහිර
5. ගෝනාපීනුවල මධ්‍යම
6. වුඩ්ලන්ඩ්වත්ත
7. දොඩම්කහවිල
8. කළුවගහ ජනපදය
9. බේරතුඩුව

09 - 790

(එප් 2) 2/64

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ සිදුකිරීම සඳහා දේවස්ථානය ලියාපදිංචි කිරීම

විවාහ ලියාපදිංචි කිරීමේ ආඥා පනතේ (112 වැනි පරිච්ඡේදය) 10 වැනි වගන්තියේ විධිවිධාන අනුව ඒකනායක මුදියන්සේලාගේ ගුණසේකර නමැති ලංකාවේ රෙජිස්ට්‍රාර් ජනරාල් වන මම ප්‍රසිද්ධ ක්‍රිස්තියානි දේවස්ථානයක් හැටියට ප්‍රයෝජනයට ගැනෙන පහත සඳහන් කරනු ලබන ගොඩනැගිල්ල, විවාහ සිදු කිරීම සඳහා විධි වූ පරිදි ලියාපදිංචි කර තිබෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

| *අංකය* | *ලියාපදිංචි කිරීමේ දිනය* | *විස්තරය* | *පිහිටීම* | *දේවගැතිතැන අයිතිකරු හෝ භාරකරු* | *ගොඩනැගිල්ල ලියාපදිංචි කරනු ලැබ ඇත්තේ කුමන ආගමක් වෙනුවෙන් ද* |
|---|---|---|---|---|---|
| 1484 | 2016.07.06 | එසෙම්බ්ලි ඔෆ් ගෝඩ් දේවස්ථානය කොටියාකුඹුර | B 112/1, මුතුපෝරුව, කොටියාකුඹුර | ගරු එම්. ගුණදස පියතුමා | එසෙම්බ්ලීස් ඔෆ් ගෝඩ් ඔෆ් සිලෝන් (1947 අංක 53 දරන පාර්ලිමේන්තු පනතේ ස්ථාපිත) |

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2016 ක්වූ අගෝස්තු මස 31 වැනි දින,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ 3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

09 - 853/1

---

(එප් 2) 2/64

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### ගොඩනැගිල්ල ලියාපදිංචි කිරීමේ සහතිකය

සහතික අංකය : 1484

විවාහ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ (112 වැනි පරිච්ඡේදය) 10 වැනි වගන්තිය යටතේ කරන ලද ඉල්ලීම ප්‍රකාශය අනුව ඒකනායක මුදියන්සේලාගේ ගුණසේකර වන මම ප්‍රසිද්ධ ක්‍රිස්තියානි දේවස්ථානයක් හැටියට ප්‍රයෝජනයට ගැනෙන පහත විස්තර කරනු ලබන ගොඩනැගිල්ල, විවාහ සිදු කිරීම සඳහා විධි වූ පරිදි ලියාපදිංචි කර තිබෙන බව සහතික කරමි.

| *විස්තර* | *පිහිටීම* | | *දිස්ත්‍රික්කය* | *දේවගැති තැන අයිතිකරු හෝ භාරකරු* | *ගොඩනැගිල්ල ලියා පදිංචි කරනු ලැබ ඇත්තේ කුමන ආගමක් වෙනුවෙන් ද* |
|---|---|---|---|---|---|
| | *ගම හෝ වීථිය සහ නගර කොට්ඨාසය* | *පත්තුව, කෝරළය හෝ දිස්ත්‍රික්කයේ වෙනත් කොට්ඨාසය* | | | |
| එසෙම්බ්ලි ඔෆ් ගෝඩ් දේවස්ථානය කොටියාකුඹුර | B 112/1, මුතුපොරුව, කොටියාකුඹුර | යටියන්තොට | කෑගල්ල | ගරු එම්. ගුණදස පියතුමා | එසෙම්බ්ලීස් ඔෆ් ගෝඩ් ඔෆ් සිලෝන් (1974 අංක 53 දරන පාර්ලිමේන්තු පනතේ ස්ථාපිත) |

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

වර්ෂ 2016ක් වූ අගෝස්තු මස 31 වැනි දින,
බත්තරමුල්ලේ දී මගේ අත්සන තබන ලදී.

09 - 853/2

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ සිදුකිරීම සඳහා දේවස්ථානය ලියාපදිංචි කිරීම

විවාහ ලියාපදිංචි කිරීමේ ආඥා පනතේ (112 වැනි පරිච්ඡේදය) 10 වැනි වගන්තියේ විධි විධාන අනුව ඒකනායක මුදියන්සේලාගේ ගුණසේකර නමැති ලංකාවේ රෙජිස්ට්‍රාර් ජනරාල් වන මම ප්‍රසිද්ධ ක්‍රිස්තියානි දේවස්ථානයක් හැටියට ප්‍රයෝජනයට ගැනෙන පහත සඳහන් කරනු ලබන ගොඩනැගිල්ල, විවාහ සිදු කිරීම සඳහා විධි වූ පරිදි ලියාපදිංචි කර තිබෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

| *අංකය* | *ලියාපදිංචි කිරීමේ දිනය* | *විස්තරය* | *පිහිටීම* | *දේවගැතිතැන අයිතිකරු හෝ භාරකරු* | *ගොඩනැගිල්ල ලියාපදිංචි කරනු ලැබ ඇත්තේ කුමන ආගමක් වෙනුවෙන් ද* |
|---|---|---|---|---|---|
| 1485 | 2016.07.13 | එසෙම්බ්ලි ඔෆ් ගෝඩ් දේවස්ථානය නුගපේ | අංක 598 නුගපේ, පමුණුගම | ගරු පැට්‍රික් ජයසූරිය පියතුමා | එසෙම්බ්ලීස් ඔෆ් ගෝඩ් ඔෆ් සිලෝන් (1947 අංක 53 දරන පාර්ලිමේන්තු පනතේ ස්ථාපිත) |

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2016 ක්වූ අගෝස්තු මස 31 වැනි දින,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ 3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

09 - 854/1

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### ගොඩනැගිල්ල ලියාපදිංචි කිරීමේ සහතිකය

සහතික අංකය : 1484

විවාහ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ (112 වැනි පරිච්ඡේදය) 10 වැනි වගන්තිය යටතේ කරන ලද ඉල්ලීම ප්‍රකාශය අනුව ඒකනායක මුදියන්සේලාගේ ගුණසේකර වන මම ප්‍රසිද්ධ ක්‍රිස්තියානි දේවස්ථානයක් හැටියට ප්‍රයෝජනයට ගැනෙන පහත විස්තර කරනු ලබන ගොඩනැගිල්ල, විවාහ සිදු කිරීම සඳහා විධි වූ පරිදි ලියාපදිංචි කර තිබෙන බව මෙයින් සහතික කරමි.

| *විස්තර* | *පිහිටීම* | | *දිස්ත්‍රික්කය* | *දේවගැති තැන අයිතිකරු හෝ භාරකරු* | *ගොඩනැගිල්ල ලියා පදිංචි කරනු ලැබ ඇත්තේ කුමන ආගමක් වෙනුවෙන් ද* |
|---|---|---|---|---|---|
| | *ගම හෝ වීථිය සහ නගර කොට්ඨාසය* | *පත්තුව, කෝරළය හෝ දිස්ත්‍රික්කයේ වෙනත් කොට්ඨාසය* | | | |
| එසෙම්බ්ලි ඔෆ් ගෝඩ් දේවස්ථානය නුගපේ. | අංක 598, නුගපේ, පමුණුගම | වත්තල | ගම්පහ | ගරු පැට්‍රික් ජයසූරිය පියතුමා | එසෙම්බ්ලීස් ඔෆ් ගෝඩ් ඔෆ් සිලෝන් (1947 අංක 53 දරන පාර්ලිමේන්තු පනතේ ස්ථාපිත) |

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

වර්ෂ 2016ක් වූ අගෝස්තු මස 31 වැනි දින,
බත්තරමුල්ලේ දී මගේ අත්සන තබන ලදී.

09 - 854/2

**කල්මුනේ දෙමළ කොට්ඨාස ප්‍රාදේශීය ලේකම් කාර්යාල වසම - අම්පාර දිස්ත්‍රික්කය**

වන්දනා පනත යටතේ 2016 වර්ෂයේ පාණ්ඩිරිප්පු ශ්‍රී තුරෝපති අම්මන් කෝවිල් උත්සවය

මෙම දේවාලයේ 2016 වර්ෂයේ වාර්ෂික මහෝත්සවය 2016 සැප්තැම්බර් මස 27 වැනි දින ආරම්භව 2016 ඔක්තෝබර් මස 15 වැනි දින නිමාව දක්වෙන බව සියලුම වන්දනාකරුවන්ට හා අනෙකුත් බැතිමතුන්ට දන්වනු කැමැත්තෙමි.

1951 මැයි මස 11 වැනි දින අංක 10247 දරන රජයේ *ගැසට් පත්‍රයේ* සඳහන් රෙගුලාසි මෙම උත්සව සමයේ පිළිපදින ලෙස සියලුම වන්දනාකරුවන්ට හා අනෙකුත් බැතිමතුන්ට දන්වනු ලැබේ.

*උත්සව භූමියේ සීතියම පහත සඳහන් පරිදි වේ :*

උතුරට : පාණ්ඩිරිප්පු පිල්ලෙයාර් කෝවිල පාර,
නැගෙනහිරටඃ පාණ්ඩිරිප්පු වෙරළ පාර,
දකුණට : කල්මුනේ පාණ්ඩිරිප්පු මායිම පාර,
බස්නාහිරට : පෙරියකුලක්කට්ටු පාණ්ඩිරිප්පු.

කේ. ලවනාතන්,
ප්‍රාදේශීය ලේකම්,
කල්මුණේ (දෙ.කො).

2016 සැප්තැම්බර් මස 05 වැනි දින.

09 - 878

---

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී.**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි (ලියාපදිංචි අංක පී. කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ අභියෝජනාව

ණය ගිණුම් අංක : 1852631.
අතුකෝරාල කොඩිතුවක්කුගේ ප්‍රදීප් කුමාර සහ ජයන්ත ලියනගම.

2016 අගෝස්තු 01 වැනි දින පවත්වන ලද රැස්වීමක දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් මෙසේ නිශ්චය කරන ලදී.

අම්බලන්තොට ප්‍රසිද්ධ නොතාරිස් S.R. විජේසිංහ විසින් 2012 සැප්තැම්බර් මස 25 වැනි දින සහතික කරන ලද අංක 4228 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි නමට ලියන ලද්දා වූ බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම අතුකෝරාල කොඩිතුවක්කුගේ ප්‍රදීප් කුමාර සහ ජයන්ත ලියනගම ණයකරුවන් හැටියට සහ අතුකෝරාල කොඩිතුවක්කුගේ ප්‍රදීප් කුමාර උකස්කරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරයන් යටතේ රුපියල් අසූහත් ලක්ෂ හතලිස්තුන් දහස් තුන්සිය දෙකයි ශත හැට එකක ( රු. 87,43,302.61) මුදලක් 2016 ජූනි මස 21 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට දැන් අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් අසූහත් ලක්ෂ හතලිස්තුන් දහස් තුන්සිය දෙකයි ශත හැට එකක (රු. 87,43,302.61) මුදල අය කර ගැනීම සඳහා සහ 2016 ජූනි මස 22 වැනි දින සිට දේපල විකිණීමේ දිනය දක්වා කාලයට රුපියල් 7,950,000 මුදල මත 12.50% ක වැඩිදුර වාර්ෂික පොලිය සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුළුව මෙතෙක් ලබාගෙන ඇත්තා වූ යම් ගෙවීම් වෙතොත් ඒවාද අඩුකොට එකී අංක 4228 දරන බැඳුම්කරය මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට උකස් කොට ඇත්තා වූ ද මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තා වූ ද දේපළ සහ පරිශ්‍රය කොළඹ 12, හල්ස්ඩෝෆ් වීදියේ 2 වන මහලේ අංක 200 දරන ස්ථානයේ පිහිටි හි ත්‍රිවංක සහ සේනානායක වෙන්දේසිකරුවන් හි අනුඥාලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. අධ්‍යක්ෂ මණ්ඩලය නිශ්චය කරනු ලබයි.

*උපලේඛනය*

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, නැගෙනහිර ගිරුවා පත්තුවේ, අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, එක්කස්ස ග්‍රාම නිලධාරි වසමේ තවලුවිල හි පිහිටි ඉඩමට බලයලත් මිනින්දෝරු L.K. ගුණසේකර විසින් 2011 දෙසැම්බර් මස 14 වැනි දින මැන සාදන ලද අංක 3265 දරන පිඹුරේ ලොට් 1B වශයෙන් දැක්වෙන ඉඩමට මායිම් වශයෙන් උතුරට : අංක 3265 දරන පිඹුරේ ලොට් 1A න් ද, නැගෙනහිරට : පාරෙන් ද, දකුණට : අංක 3265 දරන පිඹුරේ ලොට් 1C න් ද සහ බස්නාහිරට : K.G. කුසුමාවතීගේ ඉඩමෙන්ද මායිම් වූ පිඹුර ප්‍රකාරව රූඩ් එකක්

(අ. 0, රූ. 1, පර්. 0) හෙවත් හෙක්ටයාර් 0.101 විශාලත්වයෙන් යුක්ත වූ ඉඩම සමග ගොඩනැගිලි ගසකොළ සහ එහි පිහිටි සියලුම දේත් සමග වන මෙය හම්බන්තොට ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ E/195/971/97 C යටතේ ලියාපදිංචි කර ඇත.

රංජනී ගමගේ මිය,
සමාගම් ලේකම්.

2016 අගෝස්තු මස 01 වැනි දින,

09 - 871

---

**මහජන බැංකුව**

1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 (ඈ) වගන්තිය යටතේ වූ යෝජනා සම්මතයයි

වර්ෂ 2016.03.23 වැනි දින පවත්වන ලද තම රැස්වීමේදී 1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 (ඈ) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් පහත සඳහන් යෝජනා සම්මතය ඒකමතිකව සම්මත කර ගනු ලැබූ බවට මෙයින් දැනුම් දෙනු ලැබේ.

2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යථා පරිදි සංස්ථාපිත වූද, ලියාපදිංචි අංක පී.බී.72355පී.බී. දරන සහ තම ලියාපදිංචි කාර්යාලය අංක 06/01 නිදහස් මාවත, කොළඹ 07 දරන ස්ථානයේ පිහිටා ඇත්තා වූ සමාගමක් වන අනිලානා හොටෙල්ස් ඇන්ඩ් ප්‍රොපටීස් ලිමිටඩ් නම් වූ සමාගම කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ.ඩී.ආර්. මෙන්ඩිස් විසින් ලියා සහතික කළ 2012 අගොස්තු මස 13 දිනැති අංක 5738 දරන උකස් බැඳුම්කරයද, 2012 අගොස්තු මස 23 දිනැති අංක 5762 දරන උකස් බැඳුම්කරයද සහ 2013 ඔක්තෝබර් මස 04 දිනැති අංක 6030 දරන උකස් බැඳුම්කරයද යන උකස් බැඳුම්කර මත අයවීමට හිඟව ඇති ගෙවීම් පැහැර හැර ඇති හෙයින් මේ වන විට රුපියල් එකසිය විසිතුන් මිලියන හත්සිය පනස් හත්දහස් තුන්සිය විසි නවයයි ශත අසූ එකක් (රු. 123,757,329.81) මුදලක්ද, එකී උකස් බැඳුම්කර මත වන පොළියද සමග මහජන බැංකුව වෙත අයවීමට හිඟව සහ ලැබිය යුතුව ඇත.

මහජන බැංකුවේ අධ්‍යක්ෂක මණ්ඩලය 1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත මගින් ඔවුන් වෙත පැවරී ඇති බලතල යටතේ රුපියල් එකසිය විසිතුන් මිලියන හත්සිය පනස් හත්දහස් තුන්සිය විසි නවයයි ශත අසූ එකක (රු. 123,757,329.81) මුදලක්ද, 2016.02.09 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් වාර්ෂිකව සියයට පහලවයි දශම පහ (15.5%) බැගින් රුපියල් එකසිය හය මිලියන පන්සිය දහස් එකසිය විසි පහක (රු.106,500,125.00) මුදලක් මත වැඩිදුර පොළියද සහ විකුණුම් පිරිවැයද ඉන් අනතුරුව යම් මුදලක් ගෙවා ඇත්නම් එය අඩුකර විකුණුම් පිරිවැයද සහ අනෙකුත් ගාස්තුද අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ වඩාත් සවිස්තරව විස්තර කර ඇති ප්‍රසිද්ධ නොතාරිස් ඒ.ඩී.ආර්. මෙන්ඩිස් විසින් ලියා සහතික කළ 2012 අගොස්තු මස 13 වැනි දිනැති අංක 5738 දරන උකස් බැඳුම්කරයද, 2012 අගොස්තු මස 23 වැනි දිනැති අංක 5762 දරන උකස් බැඳුම්කරයද සහ 2013 ඔක්තෝබර් මස 04 වැනි දිනැති අංක 6030 දරන ඉහත කී උකස් බැඳුම්කර මගින් එකී බැංකුව වෙත උකස් කළ දේපළ සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන මෙසස් ඊ.එස්. රාමනායක මහතුන් විසින් ප්‍රසිද්ධ වෙන්දේසියක් මගින් විකිණීමට මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

**උපලේඛනය**

නැගෙනහිර පළාතේ, මඩකලපුව දිස්ත්‍රික් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කොරලායි පත්තු උතුර ප්‍රාදේශීය සභා සීමාව තුල වාකරෙයි කොරලායි පත්තු උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 211/සී, පනිච්චන්කර්නි ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, පනිච්චන්කර්නි ග්‍රාමයෙහි පනිච්චන්කර්නයෙහි පිහිටි බලයලත් මිනින්දෝරු කේ. කමලනාදන් මහතා විසින් සකස් කරන ලද 2010.06.10 දිනැති අංක කේ.කේ./බී.ටී./2010/0361 දරන පිඹුරේ නිරූපිත චලිමුනයි තෝට්ට (ට්‍රැන්කුවලටි ස්ට්‍රේට්) නැමැති ඉඩමේ ලොට් 01 වශයෙන් ලකුණු කල බෙදා වෙන් කළ ඉඩම් කොටසට මායිම්, උතුරට : මුහුද දිගට තිබෙන රක්ෂිතය, නැගෙනහිරට : දැනට ඩී.වී. ද නීස් විසින් හිමිකම් කියන උද්‍යානය ද, දකුණට : වාකරෙයි සිට මුහුද දක්වා වන පාර ද සහ බටහිරට : රජයේ යැයි කියන අවකර්කුඩකඩු සහ චල්ලෙමුනයි තෝට්ටම් යන මායිම් තුල පිහිටි අංක කේ.කේ./බී.ටී./2010/0361 දරන එකී පිඹුරට අනුව අක්කර දහයකින් (අ. 10, රූ. 0, ප. 0) සමන්විත එකී සම්පූර්ණ ඉඩම් කොටස සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි වගාවන් සහ සියලු දේද සමග වන අතර, මෙය මඩකලපු ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයෙහි අංක එන්.001/95 යටතේ ලියාපදිංචි කර ඇත.

වාකරෙයි සිට මුහුද දක්වා දිවෙන මීටර් 10 ක් පළල පාර මතින් වන මාර්ග අයිතියද සමග වේ.

අධ්‍යක්ෂක මණ්ඩලයේ නියමය පරිදි,

සහකාර සාමාන්‍යාධිකාරි (අයකිරීම්).

2016 පෙබරවාරි මස 24 වැනි දින,
මහජන බැංකුව, ආයතනික බැංකු අංශය,
අංක 35,
ඩී.ආර්. විජේවර්ධන මාවත,
කොළඹ.

09 - 891

---

**සම්පත් බැංකුව පීඑල්සී**
**(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)**

2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වෙනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

ඒ. සමරවීර සහ පී.එච්.එච්.එම්. ද සිල්වා.
ගිණුම් අංක : 1127 5463 7887.

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2016.01.28 වැනි දින පවත්වන්නට යෙදුණ රැස්වීමේදී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. ඩී. ජී. සුනාරි යන අය විසින් ලියා සහතික කරන ලද 2014 ඔක්තෝබර් 30 දාතම හා අංක 4159 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි පළමු උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළවල බදුකර අයිතීන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අනුරුද්ධිකා සමරවීර සහ පෙත්තවඩු හෙන්ද්‍රික් හේවගේ මොරිස් ද සිල්වා යන අය බන්ධනදායීන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද, එකී අංක 4159 දරන බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකා මුදලින් රුපියල් එක් කෝටි හතලිස් හත් ලක්ෂ හැත්තෑ දෙදහස් අටසිය දහසයයි ශත අනූ තුනක (රු. 14,772,816.93) මුදලක් 2015 නොවැම්බර් 19 වෙනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින්ද, එකී රුපියල් එක් කෝටි හතලිස් හත් ලක්ෂ හැත්තෑ දෙදහස් අටසිය දහසයයි ශත අනූ තුනක (රු. 14,772,816.93) මුදලද, 2016 නොවැම්බර් 20 වැනි දින සිට අංක 4159 දරන එකී බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් එක් කෝටි තිස් හය ලක්ෂ හැට හය දහසක (රු. 13,666,000) මුදලක් සඳහා වාර්ෂික සියයට දහයක් (10%) බැගින් වූ පොළියද, දැන්වීම් ගාස්තුද, දරන්නට සිදුවූ වෙනත් වියදම්ද, තදන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා අංක 4159 දරන එකී බැඳුම්කරය මගින් ලබා ගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි.ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලියයුතු යයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

### පළමු උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශසය්, අඹතලෙන් පහළ දකුණු අලුත්කුරු කෝරලේ කොටිකාවත්ත - මුල්ලේරියාව ප්‍රාදේශිය සභා සීමාවන් තුළ කොටිකාවත්ත 505, දරන ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ කොටිකාවත්තේ පිහිටි කොටිකාවත්ත පාර වරිපනම් අංක 125/7 දරන "දූවේවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එස්.බී. ආරච්චිගේ යන අය විසින් සාදන ලද 2012 මාර්තු 27 දාතම හා අංක 3044 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණයකොට බෙදාවෙන්කොට ලොට් A වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම් උතුරට : අංක 1940 දරන පිඹුරේ ලොට් B සහ පාර, නැගෙනහිරට : බලයලත් මානක තැන එච්. අනිල් පීරිස් යන අය විසින් සාදන ලද අංක 875 දරන පිඹුරේ ලොට් 2L" දකුණට : පාර සහ බස්නාහිරට : බලයලත් මානක තැන කේ. කනගරත්නම් යන අය විසින් සාදන ලද අංක 4943 දරන පිඹුරේ ලොට් 1A සහ පාර යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විසි තුනයි දශම තුනයි බිංදුවක් (A.0, R.0, P.23.30) විශාල ඉඩම් කොටස සමඟ පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලුම දේ සහ මාර්ග අයිතීන්ද, වෙනත් අයිතීන්ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබන්ධයන්ද සමඟ එකී අංක 3044 දරන පිඹුරට අනුවය.

අංක 3044 දරන එකී පිඹුරේ නිරූපිත ලොට් A පහත මැනවින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි.

එකී කොටිකාවත්ත පිහිටි "දූවේවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එස්. වික්‍රමසිංහ යන අය විසින් සාදන ලද 1992 ජනවාරි 22 දාතම හා අංක 1940 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් D වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් B සහ C නැගෙනහිරට : අංක 875 දරන පිඹුරේ ලොට් 2L, දකුණට : පාර සහ බස්නාහිරට : බලයලත් මානක තැන කේ. කනගරත්නම් යන අය විසින් සාදන ලද අංක 4943 දරන පිඹුරේ ලොට් 1A සහ පාර යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විසි තුනයි දශම තුනයි බිංදුවක් (A.0, R.0, P.23.30) විශාල ඉඩම් කොටස සමඟ පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළුම දේ සමඟ එකී අංක 1940 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍ඉරුව F30/125 යටතේ කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

පහත සඳහන් දෑ දිගේ හා ඒ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතියද සමඟය.

එකී පිඹුරු අංක 1940 හි නිරූපිත ලොට් C.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
සමාගම් ලේකම්.

09 - 911

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.